සියලුම හිමිකම් ඇවිරිණි

# මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2025

# ගණිතය

නම/විභාග අංකය - ......................................

| 10 - ශ්‍රේණිය | 1 - පත්‍රය | A කොටස | කාලය - පැය 02 |
|---|---|---|---|

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

1) රු 60000ක් වටිනා නිවසක් සඳහා 6% ක වරිපනම් බදු අය කරයි නම් ගෙවිය යුතු වාර්ෂික වරිපනම් බදු මුදල සොයන්න.

2) පැයට කිලෝමීටර 60ක ඒකාකාර වේගයෙන් ගමන් කරන වාහනයක් මිනිත්තු 10කදී යන දුර සොයන්න.

3) $\sqrt{35}$ හි අගය පළමු සන්නිකර්ෂණයෙන් පිළිතුර වන්නේ

$i)$ 5.6 $ii)$ 5.9 $iii)$ 5.7

4) $6^3 = 216$ ලඝුගණක ආකාරයෙන් ලියන්න.

5) $x^2 + 7x + 12$ හි සාධක සොයන්න.

6) පහත ත්‍රිකෝණ යුගලය අංගසම වන අවස්ථාව ලියා $B\hat{C}A$ කෝණයට සමාන කෝණය නම් කරන්න.







7) රු 24000 කින් $\frac{3}{5}$ ක් වියදම් කළ පසු ඉතිරිය කොපමණද ?

8) $ABCD$ චතුරස්‍රයේ $AB = DC$ වේ. $ABCD$ සමාන්තරාස්‍රයක් වීමට තිබිය යුතු තවත් ලක්ෂණයක් ලියන්න.



9) $B\hat{A}C = 70^0$ නම් $A\hat{C}B$ හි අගය සොයන්න.




10) කේන්ද්‍රික ඛණ්ඩයේ චාප දිග සොයන්න.




11) $(4, 6)$ සහ $(5,8)$ හරහා යන සරල රේඛාවේ අනුක්‍රමණය සොයන්න.

12) අඳුරු කළ පෙදෙස කුලක අංකනයෙන් ලියන්න.




13) $x$ හි විශාලත්වය සොයන්න.




14) ටැංකියට නලයකින් මිනිත්තුවට ලීටර් 50ක වේගයෙන් ජලය ගලාගෙන එයි. පැය $\frac{1}{2}$ කින් සම්පූර්ණ ටැංකිය පිරේ නම් ටැංකියේ ධාරිතාවය සොයන්න.

15) $\frac{2}{3x} + \frac{1}{x}$ සුළු කරන්න.

16) $x$ හි අගය සොයන්න.




17) $6, 7, 8, 8, x, 7, 5$ යන සංඛ්‍යාවල මාතය $8$ නම් $x$ හි අගය සොයන්න.

18) $x(x-5)=0$ විසඳුම් සොයන්න.

19) $4xy^2, 2x^2y$ හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

20) $ABCD$ සමාන්තරාස්‍රයේ $B\hat{C}E = 65^0$ වේ. $D\hat{A}B$ විශාලත්වය සොයන්න.




21) පෙට්ටියක එක හා සමාන පැන් 10ක් ඇත. ඉන් 3ක් නිල් පැන්ද 5ක් කලු පැන්ද වන අතර ඉතිරිය රතු පැන් වේ. පෙට්ටියෙන් අහඹු ලෙස ගන්නා පෑනක් රතු පෑනක් වීමේ සම්භාවිතාවය සොයන්න.

22) $2x-3<5$ හි විසඳුම් සංඛ්‍යා රේඛාවක දක්වන්න.

23) පහත දක්වෙන සමාන්තරාස්‍රයේ $h$ හි දිග සොයන්න.




24) $AB$ හි දිග සොයන්න.




25) $A$ සහ $B$ සමදුරින්ද, $A$ සිට $7cm$ දුරින්ද වන ලක්ෂ්‍ය 2 ක දළ සටහනක් ඇඳ ඒවා $P$ හා $Q$ ලෙස ලකුණු කරන්න.



## $B$ කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

1) නිමල්ට ලැබුණ ලොතරැයි ත්‍යාග මුදලකින් $\frac{1}{4}$ බැගින් දූවරුන් දෙදෙනාට දෙන ලදී. ඉතිරියෙන් $\frac{1}{5}$ ක් බිරිඳට දෙන ලදී. ඉන්පසු ඉතිරියෙන් $\frac{3}{8}$ ක් වැඩිහිටි නිවාසයකට දෙන ලදී. ඉතිරි වූ මුදල වන රු 5000 නිමල් බැංකුවේ තැන්පත් කරයි.

i. දූවරුන් දෙදෙනාට දුන් මුදල මුළු මුදලේ භාගයක් ලෙස දක්වන්න.

ii. බිරිඳට දුන් කොටස මුළු මුදලේ භාගයක් ලෙස දක්වන්න.

iii. ඉතිරිය මුළු මුදලේ භාගයක් ලෙස දක්වන්න.

iv. වැඩිහිටි නිවාසයට දුන් මුදල මුළු මුදලේ භාගයක් ලෙස දක්වන්න.

v. නිමල්ට ලැබුණ මුදල ත්‍යාග මුදල කොපමණද ?

10

2) උද්‍යානයක පොකුණක් සාදා ඉතිරි පෙදෙසේ තණකොළ වැවීමටත්, තවත් කොටසක පිඟන් ගඩොල් ඇල්ලීමටත් නිමල් අදහස් කරයි.




i. පොකුණේ චාප දිග සොයන්න.

ii. පොකුණේ වර්ගඵලය සොයන්න.

iii. පිඟන් ගඩොල් අල්ලන කොටසේ දිග හා පළල සොයා එහි වර්ගඵලය සොයන්න.

iv. තණකොළ වවන කොටසේ වර්ගඵලය සොයන්න.

10

3) සිසුන් පිරිසක් වඩාත්ම කැමති අහාර වර්ගය විමසීමෙන් ගත් තොරතුරු මෙම වට ප්‍රස්තාරයෙන් දැක්වේ.




i. කිරිබත් වලට කැමති පිරිස මුළු පිරිසෙන් භාගයක් ලෙස දක්වන්න.

ii. ඉඳි ආප්ප හා ආප්ප වලට කැමති පිරිස සමාන වන අතර, ඉඳි ආප්ප වලට මෙන් තුන් ගුණයක් රොටී වලට කැමතිය. රොටී වලට අදාළ කේන්ද්‍ර කෝණය සොයන්න.

iii. කිරිබත්වලට කැමති පිරිස 30ක් නම් රොටී වලට කැමති පිරිස කොපමණද? .

iv. ආප්ප හා කිරිබත් වලට කැමති පිරිස අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

v. ආප්ප කැමට කැමති පිරිසත් ඉඳි ආප්ප කැමට කැමති වූයේ නම්, දැන් ඉඳි ආප්ප කැමට කැමති පිරිස කොපමණද ?

10

4) සමන් තම වාහනයෙන් මිනිත්තු 15කින් නගරයට ගොස් මද වේලාවක් රැඳී සිට නැවත නිවසට පැමිණි ආකාරය දැක්වීමට අසම්පූර්ණ දුර කාල ප්‍රස්තාරයක් මෙහි දැක්වේ.

i. මුල් මිනිත්තු 15 දී ගිය වේගය පැයට කිලෝමීටර්වලින් දක්වන්න.

ii. ඉන්පසු මිනිත්තු 30ක් නගරයේ රැඳී සිටියේ නම් එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.



iii. ඊළඟ මිනිත්තු 30 දී නැවත නිවසට පැමිණීම ප්‍රස්තාරයේ දක්වා, නිවසට පැමිණීමේ වේගය පැයට කිලෝමීටර්වලින් දක්වන්න

iv. සමන් ගමන් කළ මුළු දුර සොයන්න.

v. සමන් නගරයට ගිය වේගය හා නැවත නිවසට පැමිණි වේගය අතර වෙනස කොපමණද ?

10

5) මිනිසුන් 12 දෙනෙකු දින 10කින් වැඩක් නිමකිරීමට වැඩක් භාර ගනියි. මුල් දින 2ක වැඩ කළ පසු මිනිසුන් 4 දෙනෙක් වැඩට ආවේ නැත. සම්පූර්ණ වැඩය දින 8කින් අවසන් කළ යුතු බව හිමිකරු පැවසුවේය.

i. මුළු වැඩ ප්‍රමාණය මිනිස් දින කීයද ?

ii. මුල් දින 2කදි කළ වැඩ ප්‍රමාණය මිනිස් දින කීයද ?

iii. ඉතිරි වැඩ ප්‍රමාණය කොපමණද ?

iv. හිමිකරුට නියමිත දිනට වැඩය අවසන් කර දීමට තව මිනිසුන් කොපමණ ප්‍රමාණයක් යෙදවිය යුතුද ?

v. එක් මිනිසෙකුට දිනකට රු 2000 ක් ගෙවයි නම්, හිමිකරුට කොපමණ වියදමක් ඒ සඳහා දැරිය යුතු වේද ?

10